# හින්දු දේව සංකල්පයන්හි වන්දනීයත්වයට පත් ගණ දෙවියන් පිළිබඳ අධ්‍යයනයක්

*සංචලා, ආර්. එච්. දර්ශනී* [1]

ගණ දෙවියන් ඥානය සෞභාග්‍ය ලබා දීමෙහි අධිපති දෙවිඳුන් ලෙස වන්දනීයත්වයට පත්ව ඇත. නේපාලය, ඉන්දුනීසියාව සහ ශ්‍රී ලංකාව යන රටවල්හිද ගණපති දේව ඇදහිල්ල ඉතා ජනප්‍රියය. **ගණපති, ගජාණන, විනායක, වක්‍රතුණ්ඩ** ආදි නාමයන්ගෙන්ද ගණ දෙවියන් හඳුන්වනු ලබයි. ගජාණන යන්නෙන් ඇත් මුහුණකින් යුක්ත වූ තැනැත්තා යන අර්ථය ගෙනෙන අතර, විනයාකර් යන්නෙන් ප්‍රධාන නායකයා යන අරුත් ගෙනේ. **විග්නේශ්වරන්** යනුවෙන් බාධක ඉවත් කරන්නා යන අර්ථය සැපයේ. ගණ දෙවියන්ගේ ආශිර්වාදය නොමැතිව කිසිදු බාධකයක් ජයගත නොහැකි යැයි දැඩි විශ්වාසයක් පවතී. ගණ දෙවියන් අවිවාහකයෙක් ලෙස සේ හැඳින්වෙයි. ගණ දෙවියන් දැක්වෙන්නේ ඇත් මුහුණකින් යුත්තෙකු ලෙසය. ඉතා විශාල උදරයක් සහිතය. මෙම දෙවියන්ගේ රුව ඇත් රුවකට සමානව නිරූපණය කර ඇත්තේ උත්පත්ති කතා අනුවය. ගණ දෙවියන්ගේ වාහනය මූෂිකයෙකි. ගණපති දෙවියන් වන්දනය සඳහා විවිධ උත්සව පවත්වනු ලබයි. කහ, රතු, කොළ වර්ණ ගණපති දේව පූජා කටයුතු සඳහා බහුලව යොදා ගන්නා වර්ණ වන අතර, මල්මාලා පැළඳවීම පූජාවන් අතර සුවිශේෂ වේ. නුවණට අධිපති දෙවියන් ලෙසින් ගණ දෙවියන් වන්දනා කරන ජනයා කුඩා දරුවනට අත්පොත් තැබීමේදී විශේෂ වතාවත් සිදු කරති. මෙම පර්යේෂණයේදී ගණ දෙවිඳුන් සම්බන්ධ තොරතුරු ගවේෂණය කෙරෙන අතර ඒ සඳහා සාහිත්‍ය මූලාශ්‍රය භාවිතා කෙරේ.

**ප්‍රමුඛ පදඃ** ගණ දෙවියන්, වන්දනාව, හින්දු දේව සංකල්ප

[1]*ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*darshanisanchala@gmail.com*